





"දරුවන් අපේ අනාගතයයි!"

ඔවුනට නිදහසේ පිපෙන්නට ඉඩ දීම ඕනෑම සමාජයක වගකීමක් එමෙන් ම යුතුකමක්. ඊට රුකුල් දීමට සුළුවෙන් හෝ යමෙක් උනන්දු වෙයි නම්, ඔහු හෝ ඇය ඒ කරන්නේ අනාගතය වෙනුවෙන් කරනා සරු ආයෝජනයක්. වෙසෙසින් ම මාධ්‍ය වල වගකීම හා යුතුකම වන්නේ ද එයමයි. මව්බිමෙන් සංක්‍රමණය වී මෙහි පදිංචිව සිටිනා අපගේ දෙවන පරම්පරාවට අයත් හිරිමල් යොවුන් ගායන හා වාද ශිල්පියෙකු ගී සඳළුවෙහි වඩා හිඳුවන්නට මේ දරනා උත්සාහයත් එවන් යුතුකමක්, වගකීමක් ඉටුකිරීමක් ලෙසින් සැළකිය හැකියි. ඔහු සිතාර් වාද්‍ය විශාරද මනීෂ විජේකෝන් ගායන ශිල්පියායි. ගායන විශාරද දෙවන කොටසට පෙනී සිටීමට සුදානම් වෙමින් සිටිනා අතරේදීයි, අප ඔහුට ඇරයුම් කරන්නේ.

පහුගිය ජනවාරියේදී විශාරද මනීෂ විජේකෝන් තම දෙවන ගීත එකතුව වන "වසන්තය ඇවිදින්" සංයුක්ත තැටිය මහනුවර ධර්මරාජ විද්‍යාලයීය ශාලාවේදී එළිදැක්වූයේ ආචාර්ය වික්ටර් රත්නායකයන්ට එය පිළිගන්වමින්. වර්තමාන යොවුන් පරපුරේ ඇති ප්‍රවණතා වලට ඉඳුරාම වෙනස් මඟක යමින් සුභාවිත ස්වතන්ත්‍ර ගී ගැයීමට කැප වී සිටිනා ඔහු අනෙක් සමකාලීනයන්ට ආදර්ශයක්.

"ඇත්තටම මේ මගේ දෙවන සංයුක්ත තැටිය, පළවෙනි එක මං කළේ 2006 වර්ෂයේ. ඒ "සුදු කාසි පෙත්ත" කියන ළමා ගීත එකතුව. ඉතින් දෙමව්පියෝ තමයි මාව පෙළඹුවේ, ගුරුතුමාත් මාව උනන්දු කළා. 2010 වර්ෂයේ විතර ඉඳලා අපි මේකට ලක ලැහැස්ති වුණා. ඉස්සර වෙලා ම මට සින්දු දෙකක් ලැබුණා සිසිර දිසානායක මාමාගෙන්. එතනින් තමයි ඇත්තටම අපි මේ දෙවෙනි එකතුව කරන්න හිතුවෙ. 2012 වසර වෙනකොට අපි සින්දු 14 ක් කළා. ඉතින් 2013 ජනවාරි 13 දයි අපි " වසන්තය ඇවිදින්" සංයුක්ත තැටිය එළි දැක්වුයේ. එදා අපි ප්‍රසංගයක් කරලයි මේ සංයුක්ත තැටිය එළි දැක්වූයේ."

ඒ මුල් ම ගී දෙක "අතුරු මිතුරු" ළමා ගී එකතුවට ඇතුලත් වූ ගී දෙකයි.

"සංගත තැටියේ එක ගීතයක් හැර අනික් සියලු ම සින්දු මම තනිවම ගායනා කළ ඒවා. එක ගීතයක් ආචාර්ය වික්ටර් රත්නායකයන් සමඟ ගායනා කළ යුග ගීතයක්. ඒ ගීතය සිසිර දිසානායක මාමා මට ලියලා දුන්න තුන්වෙන සින්දුව."

"මම අට වෙනි ශ්‍රේණියේ ඉන්න කාලෙයි "සුදු කාසි පෙත්ත" ගීත එකතුව කළේ. ඒකේ එක යුග ගායනයක් තිබුණා නිමේෂා අබේරත්න සොහොයුරියක්. මේ "වසන්තය ඇවිදින්" සංයුක්ත තැටියේ තේමාවල් විහිදිලා ගියා. මොකද විවිධ අය පද රචනා කළා. මේ ගී එකතු දෙක සංසන්දනය කළොත් ලොකු වෙනසක් තියෙනවා. කට හඬිනුත් ලොකු වෙනසක්. අදහසුත් වෙනස්. ඉතින් සමාජයට හොඳ දෙයක් දෙන්න ඕන කියලා හිතලා තමයි අපි මේ දේ කළේ."

විශාරද මනීෂ විජේකෝන් මව්බිමේ සිටියදී එහි මාධ්‍ය වලට ද සිය හැකියාව දයාද කළා.

"ඉස්සර වෙලාම මාධ්‍යවලට සම්බන්ධ වුනේ 2005 දී විතර. 2006 විතර වෙනකල් තමයි මාධ්‍යවලට සම්බන්ධ වුණේ. ඒ අධ්‍යාපන කටයුතු නිසා. "සිරස" රූපවාහිනියේ "පුංචි පැංචි" වැඩසටහනනේ ගායනා කළා. තවත් වැඩසටහන් වලට සහභාගී වුණා. ඒ ගුවන් විදුලි සංස්ථාවේ වැඩසටහන්. "සිරස" මාධ්‍ය ආයතනයෙන් මහනුවර පවත්වපු වැඩසටහන්, ප්‍රසංග වලටත් දයක වුණා. ඒ මගේ පංතියේ අයත් එක්ක.

මනීෂ පාසැලට පරිබාහිරව සංගීතය හැදෑරුවේ ඩී.එන්.එච්. සංගීත ශාලිකාවේයි. විශාරද නිර්මල හේරත් ඔහුගේ සංගීතාචාර්යවරයා යි. මනීෂ දැනට මෙල්බන් නුවර ස්වින්බර්න් විශ්ව විද්‍යාලයේ සිවිල් ඉංජිනේරු විද්‍යාව හදරන විද්‍යාර්ථියෙක්. මව්බිමේ උසස් පෙළ ප්‍රතිපල පමා වීමේ හේතුවෙන් ඔහුට තමන් රිසි සිවිල් ඉංජිනේරු විද්‍යාව හැදෑරීමට වෙනත් විශ්ව විද්‍යාලයකට ඇතුලු වීමට නොහැකි වුවත් සතුටින් දැනට සිය උසස් අධ්‍යාපනය කරගෙන යනවා. විද්‍යා විෂයන් සමග සංගීතය හැදෑරීමත්, කලා කටයුතු වලට සහභාගීවීමත් කරගෙන යන යෞවනයෙකු කාලය කළමනාකර ගන්නා අන්දම පිළිබඳව අප උනන්දු වුවා.

"ඇත්තටම මම හදරපු ගණිතය විෂයන් එක්ක සංගිතය කරන කොට ඒක මට ලොකු සහනයක්




වුණා. ඔය විෂයයන් සමබරව කරගෙන ගිය නිසා අපහසුවක් නම් වුණේ නෑ. මේ දෙක අතර සම්බන්ධයකුත් තියෙනවාලුනේ..."

"වසන්තය ඇවිදින්" ගී එකතුව එළිදැක්මේ ප්‍රසංගයේ දර්ශන අප හට ද දැකගැනීමට ලැබුණා. සැබැවින්ම එය ඉතා ඉහළ තත්වයෙන් පැවැත්වුණු ප්‍රසංගයක්.

"කලින් කිව්වා වගේ වික්ටර් රත්නායක ශූරින්ගේ ප්‍රධානත්වයෙන් අති උත්කර්ශවත් විදියට ඒ ප්‍රසංගය පැවැත්වුවා. ගී එකතුවේ තියෙන ගීත දොළහක් ගායනා කළා. සරිනි දිසානායක සොයුරිය එක්ක ගායනා කරපු යුග ගීතය ගීත එකතුවේ නැතත් ඒ ගීයත් ගායනා කළා." ජාලිය දේ " කියන සිසිර මාමා ලියපු ඒ සින්දුව එදා සරිනි එහේ හිටියේ නැතත්, නිමේෂා අබේරත්න සොයුරියත් එක්ක ගායනා කළා. විශාල පිරිසකගේ ආශිර්වාදය මට එදා ලැබුණා මං උපන් ගමේදීම."

විශාරද මනීෂ විජේකෝන් ගේ සංගීත අධ්‍යාපනය තවමත් අවසන් නැතත් මෙතෙක් ආ ගමන සරුයි, සුන්දරයි.

"මම සිතාර් වාදනයෙන් විශාරද විභාගය සමත් වුණේ 2011 දී. ගායනයෙන් විශාරද දෙවන අදියර 2013 දෙසැම්බර් මාසයේ කරන්න සුදනම් වෙනවා. සිතාර් වාදනය හදරන නිර්මල හේරත් ගුරුතුමාගේ නොයෙක් වැඩ සටහන් වලටත් මම සහභාගී වුණා. මම හතේ අටේ ඉන්න කාලෙදීම සරළ වගේම ශාස්ත්‍රීය වැඩ සටහන් වලට සහභාගී වෙන්න ලැබුණ එක ලොකු ශක්තියක්."

"පාසලේ තිබුණ හැම සංගීත වැඩ සටහනකටම මම සහභාගී වෙලා තියෙනවා. 1999, ඒ කියන්නේ මම එක වසරේ ඉන්න කොට ඉඳන් උසස් පෙළ කරපු 2012 වෙනකල්ම තිබුණ වැඩසටහන් . සමස්ත ලංකා තරඟ දෙකකින් ප්‍රථම ස්ථාන දෙකක් ලබලා තියෙනවා. ඒ තරඟ ඒකල සහ සමුහ ගායනා වාගේම වාදන තරඟ. මම එක තාල වාද්‍ය තරඟයකටත් ඉදිරිපත් වුණා. පාසැලේදීත් ඒ වැඩ වලදී උනන්දුවෙන් වැඩ කළා."

මනීෂගේ සාකච්ඡාව පටිගත කර ඔහු කී ලෙසින්ම සටහන් කළේ, ඒ තරමට ම ඔහුගේ සිංහල භාෂාව හැසිරවීමත්, කරුණු දැක්වීමත් හොඳ වු නිසයි. ඒ කරුණු හා නාමයන් ද එලෙසින්ම ලියුවේ, අපගේ නම ද ඔහු සිහිපත් කරනා නිසාවෙන් නම් නොවේ. ඔහුගේ කෘතවේදී බව පාඨකයාටත් දැනීමටයි. අනෙක එකම නමකින්, එකම කයක සැඟවී ගත්තද ඔහුට ගී ලියු රචකයා මේ ලියන්නාම නොවන නිසයි. නව පරපුරට ආදර්ශයක් දෙමින් දිගු ගමනක් ආ සහ ඉදිරියට යාමට සිතනා විශාරද මනීෂ විජේකෝන් හිරිමල් යෞවනයට අප සුභ පැතුවා. එවැන්නෙකුට අබ පියල්ලක තරමින් හෝ සහය දීමට අප ද වාසනාවන්ත වූවා නොවේ දැයි සිතනා කල ඇතිවන්නේ හද පිනායන සතුටක්මයි.

*සුසුම් සුළගේ පාවෙලා*
*ඈත ආකාසේ - සුදු වළා අතරේ වැතිරිලා*
*වසන්තය ඇවිදින් දෙරින් දෙර*
*කඳුළු සිඹිනා යෞවනේ*

*වැට කඩුලු බිඳ - ගිරි ශිඛර නැග*
*පැතුම් පුරමු අපි*
*නැගෙන රිද්මෙක - දැනෙන උණුසුම*
*තනිව විඳිමු අපි*

*හිතට වද දෙන - නුහුරු පෙම් කවි*
*ගොතමු තනිව අපි*
*දුකට කඳුලට - සතුට මුසු කර*
*විඳිමු එක්ව අපි.*

*ගායනය : විශාරද මනීෂ විජේකෝන්*
*රචනය,තනුව හා සංගීතය : විශාරද නිර්මල හේරත්*







